සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**11 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය** - **මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## බුද්ධ ධර්මය I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** බුදුරජාණන් වහන්සේ තම පළමු ධර්මදේශනය පැවැත් වූ ස්ථානය හා උන්වහන්සේගේ පරිනිර්වාණය සිදු වූ ස්ථානය දැක්වෙන වරණය කුමක් ද?
(1) ලුම්බිණි සල් උයන හා උපවත්තන සල් උයන
(2) ලුම්බිණි සල් උයන හා ඉසිපතන මිගදාය
(3) ඉසිපතන මිගදාය හා සප්තපර්ණී ගුහාව
(4) ඉසිපතන මිගදාය හා උපවත්තන සල් උයන

**2.** සිදුහත් බෝසතුන්ගේ අනුපමේය රූපශ්‍රීය හා ශාන්තබව දැක "මෙවන් පුතකු ලද මවක් පියෙක් නිවුණෝ වෙතියි" ප්‍රකාශ කරනු ලැබුවේ,
(1) සුජාතා සිටු දියණිය විසිනි.
(2) ප්‍රජාපති ගෝතමිය විසිනි.
(3) කිසා ගෝතමිය විසිනි.
(4) මාගන්ධිය බිසව විසිනි.

**3.** රෝගියකු හට වෛද්‍යවරයකුගේ සේවය (වෙදකම) තරමටම, උපස්ථායකගේ සේවය (හෙදකම) වැදගත් වන බව බුදුරජාණන් වහන්සේ ආදර්ශයෙන් ම පෙන්වා දුන් අවස්ථාවකට නිදසුනක් වන්නේ,
(1) සුනිත කථා පුවතයි.
(2) සෝපාක කථා පුවතයි.
(3) මට්ටකුණ්ඩලී කථා පුවතයි.
(4) පූතිගත්තතිස්ස කථා පුවතයි.

**4.** සංග්‍රාම භූමියක සිටින ඇතෙකුට සතුරාගෙන් කෙතරම් හී පහර වැදුන ද පසුපසට නොයන්නාක් මෙන් නින්දා ප්‍රශංසා ආදිය හමුවේ නොසැලී ඉදිරියට යාමේ හැකියාවක් බුදුරජාණන් වහන්සේට විය. මෙය,
(1) පුරිසදම්ම සාරථී ගුණය නමින් හැඳින්වේ.
(2) තාදී ගුණය නමින් හැඳින්වේ.
(3) මහා කරුණා ගුණය නමින් හැඳින්වේ.
(4) යථාවාදී තථාකාරී ගුණය නමින් හැඳින්වේ.

**5.** නිවන් පසක් කිරීමට අවශ්‍යවන මනා වූ ප්‍රතිපත්ති රකින බැවින් මහාසංඝරත්නය,
(1) සුපටිපන්න නම් වන සේක.
(2) උජුපටිපන්න නම් වන සේක.
(3) ඤායපටිපන්න නම් වන සේක.
(4) සාමීචිපටිපන්න නම් වන සේක.

**6.** බුදුරජාණන් වහන්සේ අන්‍ය ආගමික ආරාමවලට වැඩම කළ කල්හි ඉතා උණුසුම් ආකාරයෙන් උන්වහන්සේ පිළිගනු ලැබූ බව බොහෝ සූත්‍රවල දැක්වේ. මෙයින් ප්‍රකට වන්නේ උන්වහන්සේ තුළ පැවති,
(1) ආගමික සහනශීලී බවයි.
(2) උපේක්ෂා සහගත බවයි.
(3) අකම්ප්‍ය ගුණයයි.
(4) මහා කරුණා ගුණයයි.

**7.** බුදුරජාණන් වහන්සේ, පිප්ඵලී ගුහාවට වැඩමකොට සත්ත බොජ්ඣංග ධර්මය දේශනා කිරීමෙන් පසු එය ශ්‍රවණය කොට තම රෝගී තත්ත්වයෙන් මිදුනේ,
(1) මහා කාශ්‍යප හිමි ය.
(2) ගිරිමානන්ද හිමි ය.
(3) මහ මුගලන් හිමි ය.
(4) චුන්ද හිමි ය.

8. ස්වභාවික පරිසරයම දම්සභා මණ්ඩප බවට පත් කරගත් අවස්ථා රැසක් ගෞතම බුදුසිරිතෙන් ප්‍රකට වේ. ඒ අනුව උන්වහන්සේ වේදනා පරිග්‍රහ සූත්‍රය දේශනා කළේ,
(1) අචිරවතී නදී තීරයේ පිහිටි අඹ වනයේ දී ය. (2) චම්පා නුවර අසල ගග්ගරා පොකුණ සමීපයේ දී ය.
(3) ගිජ්ජකූට පර්වතයේ සූකරඛත ලෙනෙහි දී ය. (4) විශාලා මහනුවර වන පියසක දී ය.

9. සිදුහත් බෝසතාණන් වහන්සේ නෙක්ඛම්ම පාරමිතාව සම්පූර්ණ කළ ආකාරය ප්‍රකටවන ජාතක කථාව කුමක් ද?
(1) ලෝමහංස ජාතකය
(2) මඛාදේව ජාතකය
(3) තේමිය ජාතකය
(4) මහාකපි ජාතකය

10. තණ්හා මාන මිත්‍යාදෘෂ්ටියෙන් තොරව කරුණා ප්‍රඥාවෙන් යුතුව තමාගේත් අනුන්ගේත් අභිවෘද්ධිය පිණිස බලවත් උත්සාහය ඇති කරගනිමින් සම්පූර්ණ කරන පාරමිතාව හඳුන්වන්නේ,
(1) ප්‍රඥා පාරමිතාව නමිනි.
(2) වීර්ය පාරමිතාව නමිනි.
(3) අධිෂ්ඨාන පාරමිතාව නමිනි.
(4) ක්ෂාන්ති පාරමිතාව නමිනි.

11. බුදුරජාණන් වහන්සේ, ගිරිමානන්ද හිමියන්ට රෝග වැළඳීමට හේතුවන කරුණු අටක් දේශනා කළහ. එම කරුණු අතරට අයත් **නොවන** කරුණ කුමක් ද?
(1) පිත් ධාතුව කිපීම
(2) ලේ ධාතුව කිපීම
(3) ඍතු විපර්යාස හේතු වීම
(4) කර්ම විපාක පදනම් වීම

12. බුදුරජාණන් වහන්සේ, "යමෙක් මල් පලතුරු උයන්, වනාන්තර වවත් ද, ඒදඬු පාලම් පැන්හල් පොකුණු තනා දෙත් ද ඔවුන්ට දිවා රෑ පින් වැඩේ." යනුවෙන් දේශනා කළේ,
(1) අනේපිඬු සිටුතුමා ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙනි.
(2) තෝදෙය්‍ය පුත්‍ර සුභ මානවකයා ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙනි.
(3) එක්තරා දෙවියෙක් විමසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙනි.
(4) විශාඛාව විමසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙනි.

13. ජාතික, ආගමික හා සංස්කෘතික විවිධත්වයක් ඇති ශ්‍රී ලාංකික ජන සමාජයේ සහජීවනයෙන් ක්‍රියාකිරීම සඳහා අදාළ **නොවන** කරුණ කුමක් ද?
(1) කුමන ආගමකට ජාතියකට අයත් අයෙකුට වුව ද අවැඩක් නොකර සිටීම ය.
(2) සියලු ජාතීන් කෙරෙහි සතර සංග්‍රහ වස්තුවලට අනුව පැවතීම ය.
(3) වෙනත් ආගමික සිද්ධස්ථානවලට ගරු කිරීම හා හානි නොකිරීම ය.
(4) සෑම ආගමකින්ම උගන්වන්නේ එක ම දෙයක් බව පිළිගෙන සියලු ආගම් ඇදහීම ය.

14. "ස්වාමීනි මම බොහෝ දේ පාඩම් කර ඇත්තෙමි. එහෙත් දැන් ඒවා මතකයට නංවා ගත නොහැකි ය. එයට හේතුව කුමක්දැයි" බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි බමුණෙක් විමසූ කල්හි උන්වහන්සේ දේශනා කළේ,
(1) පංච නීවරණ ධර්ම සිත තුළ ක්‍රියාත්මක වීම නිසා මතකයට නොඑන බවයි.
(2) අකුසල මූල තුන සිත තුළ ක්‍රියාත්මක වීම නිසා මතකයට නොඑන බවයි.
(3) සතර අගතියෙන් යුතුව කටයුතු කිරීම නිසා මතකයට නොඑන බවයි.
(4) පස් පව්වල නිරතවීම නිසා මතකයට නොඑන බවයි.

15. කුසල ධර්ම දියුණු කරන මානසික අභ්‍යාසය භාවනාව බව පෙන්වා දී ඇත. මෙහිදී කුසල ධර්ම යන්නෙන් අදහස් වන්නේ,
(1) නිරෝගී, නිවැරදි, දක්ෂ යන්නයි.
(2) සැදැහැවත්, පිංවත්, නිවැරදි යන්නයි.
(3) යහපත්, ගුණවත්, නිරෝගී යන්නයි.
(4) දක්ෂ, ධර්මධර, ශික්ෂාකාමී යන්නයි.

16. සමථ භාවනාවේ දී කෙටි කලකින් උසස් ප්‍රතිඵල ලබාගැනීමට අනුගමනය කළ යුතු වඩාත් වැදගත් පිළිවෙත වන්නේ,
(1) සම සතලිස් කර්මස්ථාන ඉගෙන ගැනීමයි.
(2) උපදේශ සහිත ව චරිතයට සුදුසු කර්මස්ථානයක් වැඩීමයි.
(3) පුද්ගල චරිත ලක්ෂණ හඳුනාගෙන තිබීමයි.
(4) භාවනාවේ පූර්ව අවශ්‍යතා ගැන මනා දැනීමක් ලබා ගැනීමයි.

17. "ඔබ වහන්සේගේ ශාස්තෘවරයා දෙසන දහම කුමක් ද?"
"හේතු ප්‍රත්‍ය ඇතිකල ඇතිවන්නා වූ ධර්මයෝ හේතු ප්‍රත්‍ය නැතිකල නැති වෙත් යන දහම මාගේ ශාස්තෘ බුදුරජාණන් වහන්සේ දේශනා කරති."
ඉහත ප්‍රශ්නය නැගූ හා ඊට ඉහත පිළිතුර ලබාදුන් දෙදෙනා වනුයේ,
(1) සංජය පිරිවැජියා හා අස්සජි හිමි ය.
(2) කෝලිත පිරිවැජියා හා අස්සජි හිමි ය.
(3) උපතිස්ස පිරිවැජියා හා අස්සජි හිමි ය.
(4) උපතිස්ස පිරිවැජියා හා කොණ්ඩඤ්ඤ හිමි ය.

18. නාම රූප ධර්ම හේතුකොට ගෙන ආයතන හය (ෂඩායතන) ඇතිවන බව පටිච්චසමුප්පාදයේ දැක්වේ. එම ආයතන හය දැක්වෙන වරණය කුමක් ද?
(1) නාම, රූප, වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ
(2) රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම
(3) පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාශ, විඤ්ඤාණ
(4) චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන

19. පුනර්භවය තහවුරු කරන සත්ත්වයාගේ පෙර භවයෙහි පැවැත්ම හා මතු භවයෙහි පැවැත්ම දක්නා ඥානයන් හඳුන්වන්නේ,
(1) පුබ්බේ නිවාසානුස්සති හා චුතූපපාත ඥාන යනුවෙනි.
(2) පුබ්බේනිවාසානුස්සති හා ආසවක්ඛය ඥාන යනුවෙනි.
(3) චුතූපපාත හා ඉද්ධිවිධ ඥාන යනුවෙනි.
(4) දිබ්බසෝත හා පරචිත්තවිජානන ඥාන යනුවෙනි.

20. බුද්ධත්වය අනුව දුකින් මිදීමට අදාළ මඟ අනුපූර්ව සික්ඛාවකි. අනුපූර්ව ක්‍රියාවලියකි. අනුපූර්ව ප්‍රතිපදාවකි. මෙම අනුපිළිවෙළින් යා යුතු මඟින් මගෙහි පළමු පියවර ලෙස සැලකෙන්නේ,
(1) සමාධියයි. (2) ප්‍රඥාවයි. (3) ශ්‍රද්ධාවයි. (4) භාවනාවයි.

21. වන ඇතාගේ අඩි සලකුණ තුළට වනයේ වෙසෙන සිව්පා සතුන්ගේ අඩි සලකුණු ඇතුළත් කළ හැකිවන්නා සේ, අවුරුදු හතළිස් පහක් බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය ඇතුළත් කළ හැකි ප්‍රධාන ම ධර්ම කරුණ වන්නේ,
(1) සතර සතිපට්ඨානයයි.
(2) චතුරාර්ය සත්‍යයයි.
(3) සතර සංග්‍රහ වස්තුවයි.
(4) සතර ඍද්ධිපාදයයි.

22. මරණින් මතු පළමු ආත්මභාවයේ දී හෝ ඊළඟ භවයේ දී විපාකදීමට ඉදිරිපත්වන කර්ම හඳුන්වන්නේ,
(1) දිට්ඨධම්මවේදනීය කර්ම ලෙස ය.
(2) උපපජ්ජවේදනීය කර්ම ලෙස ය.
(3) අපරාපරියවේදනීය කර්ම ලෙස ය.
(4) අහෝසි කර්ම ලෙස ය.

23. වෙනත් සත්ත්ව වර්ගයා අතර ඒවා විද්‍යාත්මක වෙනස්කම් දැක්වීමට හේතුවන සාධක ඇතිබව ද මිනිසා පිළිබඳ ව එබඳු වෙනස්කම් දැක්විය නොහැකි බවත් ලිංග ජාති වශයෙන් මිනිසුන් අතර සමානත්වයක් ඇති බවත් දේශනා කරනු ලැබුවේ,
(1) වසල සූත්‍රයේ දී ය.
(2) කසීභාරද්වාජ සූත්‍රයේ දී ය.
(3) වාසෙට්ඨ සූත්‍රයේ දී ය.
(4) අග්ගඤ්ඤ සූත්‍රයේ දී ය.

24. දානය හා ධර්මානුකූල හැසිරීම යන මඟුල් කරුණු දැක්වෙන මංගල සූත්‍ර දේශනා පාඨය ඇතුළත් වරණය කුමක් ද?
(1) "දානං සීලං පරිච්චාගං"
(2) "දානං සීලං ච භාවනා"
(3) "දානං සග්ගස්ස සෝපානං"
(4) "දානඤ්ච ධම්මචරියා ච"

25. සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි පැවිදි පක්ෂය විසින් ගිහි ජනයා වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් අතරට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) පවින් වැළැක්වීම ය.
(2) යහපත් ක්‍රියාවල යෙදවීම ය.
(3) මෛත්‍රී සහගතව කතා කිරීම ය.
(4) ස්වර්ගයට මඟ කියාදීම ය.

26. පුද්ගලයකුගේ දියුණුවට මෙන් ම පරිහානියට ඉවහල්වන කරුණු සඳහන් කරමින් දේශනා කරන ලද්දේ,
(1) මංගල හා වසල සූත්‍රයි.
(2) මංගල හා සිඟාලෝවාද සූත්‍රයි.
(3) මංගල හා පරාභව සූත්‍රයි.
(4) පරාභව හා වසල සූත්‍රයි.

27. ගිහි ජීවිතය හා සම්බන්ධව සැලකීමේ දී ජීවිත හා දේපළ ආරක්ෂාවීම, පවුල් ජීවිතයේ සාමය හා සතුට ඇතිවීම, විශ්වාසය, මිත්‍ර සම්ප්‍රදාය හා සොඳුරු ඇතිවීම යන කරුණු සුරක්ෂිත වන්නේ,
(1) දස පින්කිරියවත්වල යෙදීම තුළිනි.
(2) පංචශීල ප්‍රතිපත්තියෙහි පිහිටා කටයුතු කිරීම තුළිනි.
(3) ත්‍රිවිධ පුණ්‍යක්‍රියාවල යෙදීම තුළිනි.
(4) සතර සංග්‍රහවස්තුවල යෙදීම තුළිනි.

28. "තමාට අහිත වූ අනුනට ද කිරීම නුසුදුසු ය. විඳදරාගත නොහැකි දේ කිරීම අසුදුසු ය." මෙම අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
(1) "අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති" යන්නයි.
(2) "යො ච වස්සසතං ජීවේ - දුස්සීලෝ අසමාහිතෝ" යන්නයි.
(3) "සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානි ච" යන්නයි.
(4) "තඤ්ච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති" යන්නයි.

29. නුවණින් පිරික්සා, සිතා විමසා කටයුතු කිරීම, රෝග නිධානය විමසා පිළියම් කරන වෛද්‍යවරයකු මෙන් ක්‍රියා කිරීම, දොස් නිදොස් සොයා බලා නිදොස් දේ කිරීම යන අදහස් ඇතුළත් පාඨය කුමක් ද?
(1) සුචිකම්ම (2) නිසම්මකාරී (3) සද්ධදත (4) ධම්මජීවී

30. බුදුරජාණන් වහන්සේ විසින් සිත්කලු ස්ථාන ලෙස වර්ණනා කරන ලද නිග්‍රෝධය, චෞර ප්‍රපාතය, කාලශිලාව, සප්ප සොණ්ඩික පබ්භාරය හා තපෝදාරාමය වැනි ස්ථාන පිහිටියේ,
(1) විශාලා මහනුවරයි. (2) රජගහ නුවරයි. (3) කුසිනාරා නුවරයි. (4) සැවැත් නුවරයි.

31. දීඝ නිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ සඳහන් පරිදි දල්හනේමි නම් සක්විති රජු සතුව පැවති සප්තරත්නය අතුරෙන් චක්‍රරත්නයෙන් සංකේතවත් කරන්නේ,
(1) රාජ්‍යත්වයයි. (2) රජුගේ රියසකයි. (3) චක්‍රාවාටයයි. (4) රාජ්‍ය ආරක්ෂාවයි.

32. රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ආකල්පය පැහැදිලි කෙරෙන ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A – රාජ්‍ය පාලකයින් සමගිව ක්‍රියා කළ යුතු ය.
B – රාජ්‍ය තුළ අධාර්මික ක්‍රියා මැඩලිය යුතු ය.
C – නීතිය කඩ නොකොට ආරක්ෂා කළ යුතු ය.
D – විශාරදයන්ගෙන් උපදෙස් ලබා ගත යුතු ය.
මෙම ප්‍රකාශ අතුරෙන් සප්ත අපරිහානිය ධර්මවලට අයත් ප්‍රකාශ ඇතුළත් වරණය තෝරන්න.
(1) A පමණි. (2) A සහ C පමණි. (3) B සහ C පමණි. (4) C සහ D පමණි.

33. වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ විසින් රචිත ග්‍රන්ථ ගණයට ඇතුළත් **නොවන්නේ**,
(1) මුනිගුණාලංකාරයයි. (2) බුදුගුණාලංකාරයයි.
(3) සාරාර්ථ සංග්‍රහයයි. (4) සතර බණවර සන්නයයි.

34. ඉංග්‍රීසි පාලන සමයේ පිරිහීමට පත්ව තිබූ බෞද්ධ අධ්‍යාපනය හා බුදුදහම නගා සිටුවීමට දේශහිතෛෂී පිරිස් සමග එක් වී පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවනු ලැබුවේ,
(1) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් විසිනි. (2) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් විසිනි.
(3) අනගාරික ධර්මපාලතුමන් විසිනි. (4) හෙන්රි ස්ටීල් ඔල්කට්තුමන් විසිනි.

35. පංචසතිකා සංගීතිය නමින් හැඳින්වෙන්නේ,
(1) ප්‍රථම ධර්ම සංගායනාවයි. (2) දෙවන ධර්ම සංගායනාවයි.
(3) තෙවන ධර්ම සංගායනාවයි. (4) සිව්වන ධර්ම සංගායනාවයි.

36. තෙවැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගණයට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) අභිධර්ම පිටකයට කථාවත්ථුප්පකරණය එක්වීම ය.
(2) දුස්සීල මහණුන් සසුනින් නෙරපීම ය.
(3) ධර්මය කටපාඩමින් රැගෙන යාමට භාණක පරපුරකට පැවරීම ය.
(4) දේශීය හා විදේශීය ධර්ම ප්‍රචාරය සිදුවීම ය.

37. පුරා විද්‍යාඥයින්ගේ මතයට අනුව බුද්ධ ප්‍රතිමා කලාවේ ආරම්භය සිදු වී ඇත්තේ,
(1) ක්‍රි.පූ. පළමුවන සියවසේ දී ය. (2) ක්‍රි.පූ. තෙවන සියවසේ දී ය.
(3) ක්‍රි.ව. පළමු සියවසේ දී ය. (4) ක්‍රි.ව. තෙවන සියවසේ දී ය.

38. ලක්දිව බුදුදහම ස්ථාපිත වීමත් සමග දේවානම්පියතිස්ස රජතුමා විසින් ඉදිකරන ලද ථූපාරාම දාගැබෙහි තැන්පත් කර ඇත්තේ බුදුරජාණන් වහන්සේගේ,
(1) ග්‍රීවා ධාතුව ය. (2) දකුණු අකු ධාතුව ය.
(3) ලලාට ධාතුව ය. (4) වම් අකු ධාතුව ය.

39. ස්තූපය සඳහා ඉදි වූ වෘත්තාකාර පියස්සක් සහිත ගෘහය චෛත්‍යඝර හෙවත් වටදාගෙය නමින් හැඳින්වෙන අතර පැරණි ලක්දිව චෛත්‍යඝර අතර කලාත්මක බවින් අනූන වටදාගෙය පිහිටා ඇත්තේ,
(1) ථූපාරාමයේ ය. (2) අම්බස්තලයේ ය. (3) ලංකාරාමයේ ය. (4) මැදිරිගිරියේ ය.

40. ශ්‍රී ලාංකේය බෞද්ධ සිතුවම් කලාව විෂයයෙහි භාරතීය ආභාසය ප්‍රබලව සිදුව ඇත. එහිලා ඉන්දියාවේ පැරණි අජන්තා සිතුවම්වලට නෑකම් කියන සිතුවම් විද්‍යමාන වන්නේ,
(1) දඹුලු විහාර සිතුවම් තුළයි. (2) සීගිරි සිතුවම් තුළයි.
(3) කැලණි විහාර සිතුවම් තුළයි. (4) දිඹුලාගල සිතුවම් තුළයි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2022 (2023)
## க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2022 (2023)

විෂය අංකය / பாட இலக்கம்: **11**

විෂයය / பாடம்: **බුද්ධ ධර්මය**

### I පත්‍රය - පිළිතුරු
### I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 2 | 21. | 2 | 31. | 1 |
| 02. | 3 | 12. | 3 | 22. | 2 | 32. | 2 |
| 03. | 4 | 13. | 4 | 23. | 3 | 33. | 2 |
| 04. | 2 | 14. | 1 | 24. | 4 | 34. | 4 |
| 05. | 1 | 15. | 1 | 25. | 3 | 35. | 1 |
| 06. | 1 | 16. | 2 | 26. | 3 | 36. | 3 |
| 07. | 1 | 17. | 3 | 27. | 2 | 37. | 3 |
| 08. | 3 | 18. | 4 | 28. | 3 | 38. | 2 |
| 09. | 2 | 19. | 1 | 29. | 2 | 39. | 4 |
| 10. | 2 | 20. | 3 | 30. | 2 | 40. | 2 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு 01 බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: $\frac{25}{40}$

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: $\frac{25}{40}$

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2022 (2023)

## 11 - බුද්ධ ධර්මය

### II පත්‍රය

1. (i) සිදුහත් බෝසතාණන් කිං කුසලගවේසී ව සිටි කාලයේ හමු වූ සමාපත්තිලාභී තවුසන් **දෙදෙනාගේ** නම් ලියන්න.

ආලාර කාලාම, උද්දකරාම / උද්දකරාම පුත්ත

1 - 1
2 - 2

*(ලකුණු 02යි)*

(ii) 'අරහං' බුදු ගුණයෙහි අර්ථය ලියන්න.

සියලු කෙලෙසුන්ගෙන් දුරු වූ හෙයින් ද,

රහසින්වත් පව් නොකළ හෙයින් ද,

සියලු පූජාවන් ලැබීමට සුදුසු වන හෙයින් ද " අරහං " නම් වන සේක.

1 - 0
2 - 1
3 - 2

*(ලකුණු 02යි)*

(iii) ලෝමහංස ජාතකයෙන් පුකට කෙරෙන්නේ අප මහ බෝසතාණන් වහන්සේ සම්පූර්ණ කළ කිනම් පාරමිතාව ද?

උපේක්ෂා පාරමිතාව

*(ලකුණු 02යි)*

(iv) සමථ භාවනාවෙන් ලැබිය හැකි ප්‍රයෝජන **දෙකක්** ලියා දක්වන්න.

පංච අභිඥා ලබා ගත හැකිවීම

අෂ්ට සමාපත්ති ලබා ගත හැකිවීම

ලෝභ, ද්වේශ, මෝහ ආදි කෙලෙස් සිතිවිලි පාලනය වීම

ධාරණ ශක්තිය වැඩිවීම

පාඩම් කිරීමේදී පහසුවක් දැනීම

සිතෙහි නැජතිමත් ස්වභාවයක් ඇතිවීම

අසහනය නැතිවීම

ප්‍රසන්න පෙනුමක් ඇතිවීම

කායික මානසික රෝග පීඩා දුරුවීම

නිරෝගී වීම

සිත එකඟ කර ගැනීමට උපකාරිවීම

ආදි අදාළ නිවැරදි කරුණු සඳහන් ව ඇත්නම් ලකුණු **දෙක** ලබා දෙන්න.

1 - 1
2 - 2

*(ලකුණු 02යි)*

2. (i) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දැක්වෙන පරිදි පුද්ගලයාගේ මෙලොව හිතසුව පිණිස පවතින කරුණු අතුරෙන් **දෙකක්** ලියන්න.

1. උට්ඨාන සම්පදා - උත්සාහ සම්පත්තිය
2. ආරක්ඛ සම්පදා - ආරක්ෂා සම්පත්තිය
3. කල්‍යාණ මිත්තතා - කල්‍යාණ මිත්‍ර සම්පත්තිය
4. සමජීවිකතා - අය වැය සමව දැන ජීවත්වීම

***එක් කරුණකට ලකුණ බැගින් කරුණු දෙකට ලකුණු දෙක ලබා දෙන්න.***

*(ලකුණු 02 යි)*

(ii) ඉහත (i) හි කරුණුවලින් **එක්** කරුණක් පැහැදිලි කරන්න.

**1. උට්ඨාන සම්පදා** - උත්සාහ සම්පත්තිය

තමන් කරන ඕනෑම රැකියාවක් උත්සාහයෙන්, දැහැමි දෙපයේ වීර්යයෙන්, දහඩිය වගුරුවා, ධාර්මිකව, ධාර්මික ක්‍රියා අනුගමනය කරමින් සිදුකළ යුතුය. එය උත්සාහ සම්පත්තියයි. ධාර්මික රැකියා ලෙස;

1. කෘෂි කර්මාන්තය
2. වෙළඳාම
3. ගව පාලනය
4. ආරක්ෂක සේවය
5. රාජ්‍ය සේවය
6. වෙනත් ශිල්ප කර්මාන්ත දක්වා තිබේ.

**2. ආරක්ඛ සම්පදා** - ආරක්ෂා සම්පත්තිය

ධාර්මිකව උපයා සපයාගත් ධනය විනාශ වීමට ඉඩ නොදී ආරක්ෂා කර ගැනීම ආරක්ෂා සම්පත්තියයි.
ධනය විනාශ වී යා හැකි ක්‍රම ලෙස;

1. රජයට අයත්වීම
2. සොරුන් විසින් පැහැර ගනු ලැබීම
3. ගින්නෙන් හා ජලයෙන් විනාශයට පත්වීම
4. තමා ප්‍රිය නොකරන අයට අයත්වීම ආදිය දක්වා තිබේ.

**3. කල්‍යාණ මිත්තතා** - කල්‍යාණ මිත්‍ර සම්පත්තිය

කල්‍යාණ මිත්‍රයින් හෙවත් යහපත් මිතුරන් ඇසුරු කිරීමයි. සද්ධා, සීල, චාග, පඤ්ඤා ආදී ගුණ ධර්මයන්ගෙන් පිරිපුන් යහපත් මිතුරන් ඇසුරු කිරීමයි.

**4. සමජීවිකතා** - අය වැය සමව දැන ජීවත්වීම

තමාගේ ආදායම හා වියදම හොඳින් දැන ආදායමට වඩා වියදම වැඩි නොකොට ජීවත්වීමයි. එනම් අය වැය මනාව තුලනය කරගෙන ධනය පරිහරණය කිරීමයි.

***එක් කරුණක් කෙටියෙන් හඳුන්වා තිබේනම් ලකුණු තුන දෙන්න.***

*(ලකුණු 03යි)*

(iii) ප්‍රතුකම් ඉටුකරන දැහැමි සමාජයක් ගොඩනැගීම සඳහා පංචබලි සංකල්පය ඉවහල්වන අයුරු පැහැදිලි කරන්න.

බුදුරජාණන් වහන්සේ අනේපිඬු සිටුතුමාට දේශනා කළ පත්තකම්ම සූත්‍ර දේශනාවේ දී ධාර්මිකව ධනය උපයන ආකාරය, උපයාගත් ධනය පරිභෝජනය කරන ආකාරය මෙන්ම එකී ධනය යුතුකම් ඉටුකිරීම සඳහා යොදාගත යුතු ආකාරය ද පැහැදිලි කළහ. යුතුකම් ඉටු කරන දැහැමි සමාජයක් ගොඩ නැගීම සඳහා එම සූත්‍රාගත පංච බලි සංකල්පය ඉවහල්වේ.

පංච බලි යනු;

1. ඥාති බලි
2. අතිථි බලි
3. පුබ්බපේත බලි
4. රාජ බලි
5. දේවතා බලි යන කරුණු පහයි.

ගිහියකු පංච බලි නම්වූ ඉහත යුතුකම් පහ ඉටු කළ යුතුය.

**ඥාති බලි** - ඥාති බලි යනු උපයාගත් ධනයෙන් ඥාතීන්ට සැලකීම හෙවත් යුතුකම් ඉටු කිරීමයි.

**අතිථි බලි** - අතිථි බලි යනු ආගන්තුකයින්ට සංග්‍රහ සත්කාර කිරීමයි.

**පුබ්බපේත බලි** - පුබ්බපේත බලි යනු මිය ගිය ඥාතීන්ට පින්පෙත් ලබාදීමෙන් යුතුකම් ඉටු කිරීමයි.

**රාජ බලි** - රාජ බලි යනු රට වැසියන් වශයෙන් ගෙවිය යුතු බදු ආදිය ගෙවීමෙන් රජයට යුතුකම් ඉටු කිරීමයි.

**දේවතා බලි** - දේවතා බලි යනු දෙවියන්ට පිංදීම ආදී ආගමික කටයුතු සිදු කිරීමයි.

සමාජයේ ඒ ඒ කණ්ඩායම්වලට තමාගෙන් ඉටුවිය යුතු මෙම යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීමෙන් දැහැමි සමාජයක් ගොඩ නැගේ.

*පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.*

*(ලකුණු 05 යි)*

3. (i) "නතං කම්මං කතං සාධු" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කොට ලියන්න.

නතං කම්මං කතං සාධු
යං කත්වා අනුතප්පති
යස්සඅස්සුමුඛෝ රෝදං
විපාකං පටිසේවති

(ධම්ම පදය, බාල වග්ගය, 08 ගාථාව)

*ගාථාව සම්පූර්ණයෙන් ලියා ඇත්නම් ලකුණු දෙක ප්‍රදානය කරන්න.*

*අක්ෂර වින්‍යාසය නොසලකන්න.*

*(ලකුණු 02 යි.)*

**(ii) සතර සංග්‍රහ වස්තු නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න.**

1. දානය
2. ප්‍රිය වචනය
3. අර්ථචර්යාව
4. සමානාත්මතාව

**1. දානය**

ජනතාවගේ ආර්ථික අභිවෘද්ධිය උදාකරලීම පාලකයාගේ වගකීම වේ. එහිලා ජීවනෝපාය මාර්ග සැපයීම, බත් වැටුප් ලබා දීම ආදිය දානය ලෙස හැඳින්වේ.

**2. ප්‍රිය වචන**

ජනතාවගේ යහපත හා අභිවෘද්ධිය සඳහා ප්‍රිය වචන කථා කිරීමයි. බොරු කීම, කේලාම් කීම, හිස්වචන හා පරුෂ වචන කතා කිරීමෙන් වැළකී සත්‍ය හා මිහිරි වචන කතා කිරීම මෙයින් අදහස් කෙරේ.

**3. අර්ථචර්යාව**

රටවැසියන්ගේ යහපත හා දියුණුව පිණිස සිය කාලය, ශ්‍රමය, ධනය වැය කරමින් ජනතා සේවයේ යෙදීම අර්ථචර්යාවයි.

**4. සමානාත්මතාව**

අගතිගාමී නොවී සියලු රටවැසියන් කෙරෙහි සම සිතින් කටයුතු කිරීමයි.

***සතර සංග්‍රහ වස්තු නම් කිරීමට ලකුණු එකයි.***

***ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කිරීමට ලකුණු දෙකයි.***

***(ලකුණු 03 යි)***

**(iii) ධාර්මික රාජ්‍ය පාලනයක් සඳහා බෞද්ධ දේශපාලන මූලධර්ම ඉවහල්වන ආකාරය විස්තර කරන්න.**

ධාර්මික රාජ්‍ය පාලනයක් සඳහා බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ දේශපාලන මූලධර්ම අදාළ කරගත හැකිය. ජනතා හිතවාදී පාලකයකු විසින් අනුගමනය කළ යුතුයැයි බුදු දහමේ ඉදිරිපත් කොට ඇති දස රාජධර්ම, දස සක්විතිවත්, සප්ත අපරිහානීය ධර්ම, පංචසීල ප්‍රතිපත්තිය, සතර සංග්‍රහ වස්තු, සිව් බඹ විහරණ, සතර අගතියෙන් තොරවීම ආදි රාජ්‍ය පාලන මූලධර්ම අනුගමනය කිරීමෙන් සියලු රටවැසියන්ට අර්ථවත් සේවාවක් ඉටුකිරීමට ඉඩ සැලසේ. එසේම මෙම රාජ්‍ය පාලන මූලධර්ම අනුගමනය කිරීමෙන් සිය රාජ්‍යයෙහි පරිහානිය වළක්වා, අභිවෘද්ධිය සලසා ගැනීමට අවස්ථාව සැලසේ.

***කරුණු දෙකක්වත් ඇසුරෙන් පිළිතුර සකස් විය යුතුය.***

***පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න.***

***(ලකුණු 05 යි)***

**5. (i) පංච නියාම ධර්ම අතුරෙන් දෙකක් නම් කරන්න.**

පංච නියාම ධර්ම

1. උතු නියාම
2. බීජ නියාම
3. කම්ම නියාම
4. ධම්ම නියාම
5. චිත්ත නියාම

***කරුණු දෙකක් නම් කර තිබෙනම් ලකුණු දෙක දෙන්න.***
***(ලකුණු 02 යි)***

**(ii) විපාක දෙන ආකාරය අනුව කර්මයේ ප්‍රභේද හතර දක්වා ඉන් එකක් සැකෙවින් පහදන්න.**

1. ගරුක කර්ම
2. ආසන්න කර්ම
3. ආචිණ්ණ කර්ම
4. කටත්තා කර්ම

**1. ගරුක කර්ම**

වෙනත් කර්මයකින් වළකාලිය නොහැකි වඩාත් ශක්තිමත් බලසම්පන්න කුසලාකුසල කර්ම ගරුක කර්ම නම් වේ. පංචානන්තරිය පාපකර්ම හා නියත මිථ්‍යාදෘෂ්ටිය අකුසල පක්ෂයේත්, පංච අභිඥා, අෂ්ට සමාපත්ති කුසල පක්ෂයේත් ගරුක කර්ම ගණයට අයත් වේ.

**2. ආසන්න කර්ම**

මරණාසන්න අවස්ථාවේදී කරන ලද්දා වූ හෝ කලින් සිදුකරන ලදුව මරණාසන්න මොහොතේ සිතට නැගුණා වූ හෝ කුසලාකුසල කර්ම ආසන්න කර්ම නම් වේ.

**3. ආචිණ්ණ කර්ම**

ජීවිත පුරුද්දක් ලෙස සිදු කරන ලද කුසලාකුසල කර්ම හා කලින් කරන ලදුව නිරන්තරයෙන් සිහි කරන ලද කුසලාකුසල කර්ම ආචිණ්ණ කර්ම නම් වේ.

**4. කටත්තා කර්ම**

දැඩි චේතනාවක් නොමැතිව සිදු වන අසම්පූර්ණ කුසලාකුසල කර්ම කටත්තා කර්ම නම් වේ.

***ප්‍රභේද හතර නම් කිරීමට ලකුණු එකයි.***
***එක් කරුණක් කෙටියෙන් පැහැදිලි කිරීමට ලකුණු දෙකක් ලෙස ලකුණු තුන ලබා දෙන්න.***
***(ලකුණු 03 යි.)***

(iii) ශිෂ්‍ය ජීවිතයේ ගැටලු විසඳාගැනීම සඳහා පටිච්ච සමුප්පාද න්‍යාය උපයෝගී කොටගත හැකි ආකාරය පහදන්න.

ශිෂ්‍ය ජීවිතයේ ගැටලු විසඳා ගැනීමට පටිච්ච සමුප්පාද න්‍යාය උපයෝගී කොට ගත හැකිය. ඕනෑම ගැටලුවක් ඇතිවීම, ඒ සඳහා බලපාන හේතු හඳුනා ගැනීම, ඊට විසඳුමක් සොයා ගැනීම හා ඒ සඳහා ඇති ක්‍රියාමාර්ග පිළිබඳ තාර්කික පදනමක් හේතුඵල ධර්මයෙන් ඉදිරිපත් කෙරේ. ගැටලුවේ සැබෑ හේතුව දුටු විට එම හේතුවට පිළියම් යෙදීමෙන් ගැටලුව නිරාකරණය කරගත හැකිය. විභාග අසමත්වීම ආදී ඕනෑම ශිෂ්‍ය ගැටලුවක් යථාර්ථවාදීව විශ්ලේෂණය කොට විසඳුම් සොයා ගැනීමට බුද්ධ දහමේ ඉදිරිපත් වන හේතුඵලවාදී න්‍යාය අදාළ කරගත හැකිය.

*පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න.*

*(ලකුණු 05 යි.)*

6. (i) දෙවන ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා හේතු වූ කරුණු අතුරෙන් **දෙකක්** ගෙනහැර දක්වන්න.

වජ්ජිපුත්තක භික්ෂූන් ඉදිරිපත් කළ දස වස්තුව -

දුර්මතධාරී භික්ෂූන් සසුන් ගත වී සිටීම,

පිරිසිදු බුද්ධහම ආරක්ෂා කර දිගටම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව

*ආදී කරුණු දෙකක් ඇත්නම් ලකුණු දෙක ලබා දෙන්න.*

*(ලකුණු 02යි.)*

(ii) එම ධර්ම සංගායනාව පැවැත් වූ ස්ථානය, රාජානුග්‍රහය ලබා දුන් පාලකයා හා මූලිකත්වය ගෙන ක්‍රියා කළ මහරහතන් වහන්සේ ලියා දක්වන්න.

**පැවැත් වූ ස්ථානය** - විශාලා මහනුවර වාලුකාරාමයේදී / විශාලා මහනුවරදී

**රාජානුග්‍රහය ලබා දුන් පාලකයා** - කාලාශෝක රජතුමා

**මූලිකත්වය ගෙන ක්‍රියාකළ මහරහතන් වහන්සේ** - සබ්බකාමී මහරහතන් වහන්සේ.

*එක් කරුණකට ලකුණ බැගින් ලකුණු තුන දෙන්න.*

*(ලකුණු 03 යි.)*

(iii) දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ශාසන ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය පහදන්න.

දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ශාසන ඉතිහාසය කෙරෙහි දැඩිව බලපා ඇත. දස වස්තුව පිළිගත් දුර්මතධාරී වජ්ජිපුත්තක භික්ෂූහු සංගායනාවෙන් ඉවත් කොට ධර්ම විනය ගරු කළ මහරහතන් වහන්සේලා විසින් දෙවන ධර්ම සංගායනාව පවත්වා සසුන ස්ථාවර කළහ. දස වස්තුව පිළිගත් භික්ෂු පිරිස වෙනම සංගායනාවක් පවත්වා මහාසාංඝික නමින් සම්ප්‍රදායක් පිහිටුවා ගත්හ. ඒ අනුව නිකාය භේදය ඇතිවීම, දස වස්තුව ධර්ම විනයානුකූලව විනිශ්චය කොට බැහැර කිරීම හා එම අදහස් දැරූ වජ්ජි භික්ෂූන් සංගායනාවෙන් ඉවත් කිරීම නිසා සාසනය ස්ථාවර වීම. බුද්ධහම තරහකාරීව ව්‍යාප්ත වීමට මඟ පෑදීම ආදිය මෙම සංගායනාවේ ප්‍රතිඵල ලෙස දැක්විය හැකිය.

*පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.*

*(ලකුණු 05 යි.)*

**7. පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට කෙටි සටහන් ලියන්න.**

(i) රේරුකානේ චන්දවිමල මහනාහිමි

1897 ජූලි මස 19 වෙනි දින කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ රේරුකාන ග්‍රාමයේ උපත ලද රුබෙල් ගුණවර්ධන සිංඤෝ කුමරා 1906 ජනවාරි 08 වෙනි දින බුරුම ජාතික පූ. විසුද්ධාචාර හිමියන් වෙතින් පැවිදි දිවියට එළඹ රේරුකානේ චන්දවිමල යන නම ලැබිය. පසුව බුරුම රටට වැඩම කොට බුරුම භාෂාව පුහුණු කොට, ත්‍රිපිටක ධර්මය හා භාවනා ඉගෙනගෙන වසරකින් උපසම්පදාව ලබා පසු කාලෙක ශ්‍රී ලංකාවට වැඩම කළේය.

මෙරටට වැඩම කිරීමෙන් පසු උන්වහන්සේ සම්බුද්ධ සසුනේ දියුණුව වෙනුවෙන් විශාල මෙහෙයක් ඉටු කළහ. බෞද්ධයාගේ දහම් දැනුම වර්ධනය කරලීම සඳහා ග්‍රන්ථ රාශියක් උන්වහන්සේ විසින් රචනා කරන ලදී. මිත්‍රානම් අල්පේච්ඡ ජීවිතයක් ගතකළ උන්වහන්සේ අවුරුදු 100 ක් ආයු වළඳා 1997ජූලි 04 දින අපවත් වී වදාළහ.

*පිළිතුර සම්බන්ධයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න.*

*(ලකුණු 05යි.)*

(ii) මෛත්‍රී භාවනාව

සමථ භාවනාවට අයත් කර්මස්ථාන 40 අතුරින් එකකි මෙත්තානුස්සති කර්මස්ථානය. එම කර්මස්ථානය අනුව කරන භාවනාව මෛත්‍රී භාවනාවයි. කරණීයමෙත්ත සූත්‍රයේ දී මෛත්‍රී වඩන්නාතුළ තිබිය යුතු ගුණාංග, මෛත්‍රිය වඩන ආකාරය, එහි ආනිසංස ආදිය විස්තර වේ. මෛත්‍රිය භාවනාවක් ලෙස වැඩීමේදී පළමුව තමාටත් ඉන්පසු සම්භාෂමිත්‍රයන් ආදී වශයෙන් සමස්ත ලෝකයාමිත්වම මෙත් සිත පැතිරවිය යුතු ආකාරය විස්තර වේ. මෙත් වැඩීමේ ආනිසංස එකොළොසක් දක්වා තිබේ.

*පිළිතුර සම්බන්ධයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න.*

*(ලකුණු 05යි.)*

(iii) සම්මා ආජීව

සම්මා ආජීව යනු ආර්ය අෂ්ටාංගික මාර්ගයේ පස්වන මාර්ගාංගයයි. වැරදි සහගත ජීවන වෘත්තීන්ගෙන් වැළකී දැහැමි ජීවන වෘත්තියක යෙදීම සම්මා ආජීවයයි. නිවැරදි, දැහැමි දිවි පැවැත්ම මින් අදහස් වේ. පංචවිධ වැරදි වෙළඳාම් ආදියෙන් වැළකිය යුතුය. එනම්;

1. අවි ආයුධ වෙළඳාම
2. සත්ව වෙළඳාම
3. මස්මාංශ වෙළඳාම
4. මත්ද්‍රව්‍ය වෙළඳාම
5. විසවිෂ වෙළඳාම යන අදැහැමි වෙළඳාම්වලින් වැළකී දැහැමි වෙළඳාමහි යෙදීම මීට අයත් වේ.

*පිළිතුර සම්බන්ධයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න.*

*(ලකුණු 05යි.)*

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) රේරුකානේ චන්ද්‍රවිමල මහනාහිමි

1897 ජූලි මස 19 වෙනි දින කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ රේරුකාන ග්‍රාමයේ උපත ලද රුණෙල් ගුණවර්ධන සිංඤෝ කුමරා 1906 ජනවාරි 08 වෙනි දින බුරුම ජාතික ශ්‍රී. විනාලංකාර හිමියන් වෙතින් පැවිදි දිවියට එළඹ රේරුකානේ චන්ද්‍රවිමල යන නම ලැබිය. පසුව බුරුම රටට වැඩම කොට බුරුම භාෂාව පුහුණු කොට, ත්‍රිපිටක ධර්මය හා භාවනා ඉගෙනගෙන එරටදීම උපසම්පදාව ලබා පසු කාලෙක ශ්‍රී ලංකාවට වැඩම කළේය.
මෙරටට වැඩම කිරීමෙන් පසු උන්වහන්සේ සම්බුද්ධ සසුනේ දියුණුව වෙනුවෙන් විශාල මෙහෙයක් ඉටු කළහ. අභිධර්මයෙහි දහම් දැනුම වර්ධනය කරලීම සඳහා ග්‍රන්ථ රාශියක් උන්වහන්සේ විසින් රචනා කරන ලදී. මිත්‍රකාමී අල්පේච්ඡ ජීවිතයක් ගතකළ උන්වහන්සේ අවුරුදු 100 ක් ආයු වළඳා 1997 ජූලි 04 දින අපවත් වී වදාළහ.

*පිළිතුර සම්පූර්ණයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න.*
*(ලකුණු 05යි.)*

(ii) මෛත්‍රී භාවනාව

සමථ භාවනාවට අයත් කර්මස්ථාන 40 අතුරින් එකකි මෛත්‍රානුස්සති කර්මස්ථානය. එම කර්මස්ථානය අනුව කරන භාවනාව මෛත්‍රී භාවනාවයි. කරණීයමෙත්ත සූත්‍රයේ දී මෛත්‍රී වඩන්නා තුළ තිබිය යුතු ගුණාංග, මෛත්‍රිය වඩන ආකාරය, එහි ආනිසංස ආදිය විස්තර වේ. මෛත්‍රිය භාවනාවක් ලෙස වැඩීමේදී පළමුව තමාටත් ඉන්පසු සමීපතමයින්ටත් ආදී වශයෙන් සමස්ත ලෝකවාසීන්ටම මෙත් සිත පැතිරවිය යුතු ආකාරය විස්තර වේ. මෙත් වැඩීමේ ආනිසංස එකොළොස් දක්වා තිබේ.

*පිළිතුර සම්පූර්ණයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න.*
*(ලකුණු 05යි.)*

(iii) සම්මා ආජීව

සම්මා ආජීව යනු ආර්ය අෂ්ටාංගික මාර්ගයේ පස්වන මාර්ගාංගයයි. වැරදි සහගත ජීවන වෘත්තීන්ගෙන් වැළකී දැහැමි ජීවන වෘත්තියක යෙදීම සම්මා ආජීවයයි. නිවැරදි, දැහැමි දිවි පැවැත්ම මින් අදහස් වේ. පංචවිධ වැරදි වෙළඳාම් ආදියෙන් වැළකිය යුතුය. එනම්;

1. අවි ආයුධ වෙළඳාම
2. සත්ව වෙළඳාම
3. මස්මාංශ වෙළඳාම
4. මත්ද්‍රව්‍ය වෙළඳාම
5. විෂවිෂ වෙළඳාම යන අදැහැමි වෙළඳාම්වලින් වැළකී දැහැමි වෙළඳාමෙහි යෙදීම මීට අයත් වේ.

*පිළිතුර සම්පූර්ණයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න.*
*(ලකුණු 05යි.)*